

# වාණිජ මණ්ඩලයක් කියන්නේ ව්‍යාපාරිකයින්ගේ මහගෙදරයි

වාණිජ මණ්ඩලයක් කියූ සැණින් ඔබේ මතකයට නැගෙන්නේ කුමක්ද? ව්‍යාපාර ක්ෂේත්‍රයේ බොහෝ දෙනෙක් මේ නම අසා තිබුණත් එහි කාර්යය භාරය පිළිබඳව බොහෝදෙනෙක්ට නිසි අවබෝධයක් නැහැ. ඇත්තටම වාණිජ මණ්ඩලයක් කියන්නේ මොකද්ද? වාණිජ මණ්ඩලයකින් ප්‍රදේශයේ ව්‍යාපාරිකයින්ට ලබාදෙන සේවාව කෙබඳුද? මේ ඒ පිළිබඳ අදහස් දක්වන සබරගමුව වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී අජිත් රණසිංහ මහතා.

**අජිත් රණසිංහ - සාමාන්‍යාධිකාරී**
**සබරගමුව වාණිජ හා කර්මාන්ත මණ්ඩලය**

**වාණිජ මණ්ඩලයක් කියන්නේ මොකක්ද?**

වාණිජ මණ්ඩලය කියන්නේ රාජ්‍ය අයතනයක ක්‍රමවේදය අනුව ක්‍රියාත්මක වන ව්‍යාපාර සංවර්ධනය සඳහා කටයුතු කරන පෞද්ගලික අංශයේ ආයතනයක්. ප්‍රදේශයේ සිටින ව්‍යාපාරික ප්‍රජාව තමයි මෙහි සාමාජිකත්වය ලබාසිටින්නේ. මෙය ප්‍රදේශයේ ජීවත් වන ව්‍යාපාරික ප්‍රජාව විසින් පිහිටුවා ගෙන තිබෙන ආයතනයක්. එහිදී වාර්ෂිකව පවත්වනු ලබන වාර්ෂික මහසභාවේ දී එක් ගිණුම් වර්ෂයක් සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයක් තෝරා පත්කරගනු ලබනවා. අධ්‍යක්ෂක මණ්ඩලයේ ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික් වාණිජ මණ්ඩල අනුව වෙනස්. අධ්‍යක්ෂක මණ්ඩලයට අමතරව ප්‍රධාන විධායක නිලධාරියෙක් සහ අනෙකුත් සේවක මණ්ඩලයේ සාමාජිකයින් ඇතුළත්. ඒ අනුව තමයි ආයතනයේ ව්‍යුහය සකස් වෙන්නෙ.

**වාණිජ මණ්ඩලයක ප්‍රධාන අරමුණ පිළිබඳ කිව්වොත්...**

වාණිජ මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වන්නේ ප්‍රදේශයේ ව්‍යාපාර කරගෙන යාමට අවශ්‍ය හිතකර පරිසරයක් ඇති කිරීමත් ව්‍යාපාර සංවර්ධනය කිරීමට අවශ්‍ය සේවාවන් සැපයීමත් එකම වහලක් යටතේ ලබාදීමයි. ඒ යටතේ ව්‍යාපාර සංවර්ධනය සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම, පුහුණුව, ව්‍යාපාර සම්බන්ධතා ඇතිකර දීම, ව්‍යවසායකයන්ගේ කළමනාකරණ දැනුම වර්ධනය කරදීම, ව්‍යාපාරික ප්‍රජාවගේ ගැටලු සඳහා රාජ්‍ය අංශයේ සමඟ සාකච්ඡාකර විසඳුම් ලබාගැනීම, ආදිය මෙහිදී වැදගත් වේ. බොහෝවිට වාණිජ මණ්ඩලයකින් සිදුවන්නේ දැනට තිබෙන ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීමයි. නමුත් අලුතින් ආරම්භ කරන ව්‍යාපාරවලට මඟපෙන්වීමක් වාණිජ

මණ්ඩලය හරහා සිදුකරනවා. වාණිජ මණ්ඩලයකින් ලැබෙන සේවාවන් දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙනස් වෙන්න පුළුවන්. ඒ වගේම ව්‍යාපාරවල සංයුතිය අනුව එහි ඇති අංශ වෙනස් වනවා.

ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකටම දිස්ත්‍රික් වාණිජ මණ්ඩලයක් පිහිටුවා තිබෙනවා. සබරගමුව වාණිජ මණ්ඩලය පළාත් වාණිජ මණ්ඩලයක්.

**කාන්තා වාණිජ මණ්ඩල කියන්නේ මොනවාද?**

ඇතැම් දිස්ත්‍රික්කවල ප්‍රධාන වාණිජ මණ්ඩලයට අමතරව කාන්තා වාණිජ මණ්ඩලයක් ක්‍රියාත්මක වෙනවා. කාන්තා ව්‍යවසායකයින්ට අතහිත ලබාදීම තමයි කාන්තා වාණිජ මණ්ඩලයක අරමුණ වෙන්නේ.

**සබරගමුව පළාත් වාණිජ මණ්ඩලය හරහා ලබාදෙන සේවාව පිළිබඳ පැහැදිලි කළොත්.....**

අපේ ප්‍රධානම කාර්යය භාරය දැනට තිබෙන ව්‍යාපාර දියුණු මට්ටමකට ගෙන ඒම. මේ කාර්යය අදාළ ප්‍රදේශයේ ව්‍යාපාරවල පවතින සංයුතිය, ව්‍යාපාර ක්ෂේත්‍ර මත වෙනස්වීම් සිදුවනවා. සබරගමුව පළාතේ විශේෂයෙන්ම මැණික්, රබර්, තේ වැනි ව්‍යපාර වගේම ඇඹිලිපිටිය ප්‍රදේශයේ නම් කෘෂිකර්මාන්තයේ නියැලෙන පිරිස වැඩිවශයෙන් දකින්න පුළුවන්. මේ ව්‍යාපාරවල හැඩතලය හඳුනාගෙන ඒ ඒ ව්‍යාපාර සංවර්ධනය සඳහා අවශ්‍ය වන විශේෂිත වූ සේවාවන් අප විසින් ඔවුන්ට ලබාදීම. එහිදී ව්‍යාපෘති වාර්තාව සාදාදීමේ සිට ව්‍යාපාරයේ විවිධ අවධින්වලදී සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය වන තාක්ෂණික, කළමනාකරණ, උපදේශන සේවාවන් ලබාදීම සිදු කරනු ලබනවා.

**මේ සෑම සේවාවක්ම සාමාජිකයින්ට ලබාදෙන්නේ නොමිලේ ද?**

නැහැ. ඇතැම් සේවාවන්ට සුළු අයකිරීමක් සිදුකරනවා. ඒ දේවල්වලින් ලැබෙන ආදායමින් තමයි වාණිජ මණ්ඩලය පවත්වාගෙන යන්නේ.

> අපේ රටේ රජය විසින් වාණිජ මණ්ඩලවලට ලබාදී තිබෙන්නේ ඉතාම අඩු තක්සේරුවක්.

# අපේ රටේ වාණිජ මණ්ඩල ක්‍රියාත්මක වන්නේ හුදෙකලා වූ ආයතනයක් ලෙසයි.



**ඇත්තටම ශ්‍රී ලංකාවේ වාණිජ මණ්ඩලයකට තිබෙන පිළිගැනීම කෙබඳුද?**

ඒ ගැන නම් තිබෙන්නේ තරමක කණගාටුදායක තත්ත්වයක්. ඒත් අපි බැලුවොත් ලෝකයේ දියුණු රටවල ව්‍යාපාරයක් ආරම්භ කරනවා නම් අදාළ ප්‍රදේශයේ වාණිජ මණ්ඩලයේ සාමාජිකත්වය නොමැති නම් ඔවුන්ට ව්‍යපාර ආරම්භ කිරීමට හැකියාවක් නැහැ. නමුත් ලංකාවේ එවැනි තත්ත්වයක් නැහැ. අපේ රටේ රජය විසින් වාණිජ මණ්ඩලවලට ලබාදී තිබෙන්නේ ඉතාම අඩු තක්සේරුවක්. අපේ රටේ ව්‍යපාර සංවර්ධනය සඳහා වාණිජ මණ්ඩලවලින් ලැබෙන්නේ විශාල දායකත්වයක්. නමුත් රජය මඟින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා වාණිජ මණ්ඩලයකින් ලබාගන්නා සේවාව ඉතා අවම මට්ටමකයි පවතින්නේ. ඇත්තටම කිව්වොත් අපේ රටේ වාණිජ මණ්ඩල ක්‍රියාත්මක වන්නේ හුදෙකලා වූ ආයතනයක් ලෙසයි.

**ඒ කියන්නේ වාණිජ මණ්ඩලවලටත් විශාල ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදුවෙනවා.....**

ඇත්තම කිව්වොත් වාණිජ මණ්ඩල නඩත්තු කරන්නේ තරමක් අසීරුවෙන්. ව්‍යාපාරිකයින්ගෙන් පවා අවම සාමාජික මුදලක් තමයි අය කරන්නේ. දැනට අපේ රටේ තිබෙන බොහෝමයක් වාණිජ මණ්ඩල ඉදිරියට පවත්වාගෙන යාමේදී විශාල ප්‍රශ්නවලට මුහුණදීමට සිදු වී තිබෙනවා. වාණිජ මණ්ඩලයක් ශක්තිමත්ව සිටිනවා නම්, එයට හේතුව ලෙස එහි සිටින අධ්‍යක්ෂක මණ්ඩලයේ සහ කාර්යය මණ්ඩලයේ කැපවීම මත රඳා පවතින දෙයක් වශයෙන් හැඳින්වීම පුළුවන්. අපට ඉදිරියට යන්න රජයෙන් හෝ වෙනත් සැළකිය යුතු ආයතනයකින් සුදුසු පරිසරයක් සකස්කරදී නැහැ. අපි මේ පිළිබඳ වගකිවයුත්තන් සමඟ සාකච්ඡා කළත් තවමත් සතුටුදායක පිළිතුරක් ලැබී නැහැ.

එවගේම අවම වශයෙන් වාණිජ මණ්ඩලයක් පවත්වාගැනීමට ගොඩනැගිල්ලක් හෝ රජයෙන් ලබාදිය හැකි නම් එය ඉතාම වටිනවා. දිස්ත්‍රික්කයක ව්‍යපාර සංවර්ධනය කිරීමට මහඟු මෙහෙවරක් ඉටුකරන ආයතනයක් වාණිජ මණ්ඩලය කියන්නේ. ඒ හඬට තමයි ව්‍යාපාරිකයින් එකතු වෙලා ඉන්නෙ. ඇත්තටම වාණිජ මණ්ඩලයක් කියන්නේ අදාළ දිස්ත්‍රික්කය තුළ සිටින ව්‍යාපාරිකයින්ගේ මහගෙදර. මේ නිසා වාණිජ මණ්ඩලවලට අවශ්‍ය මූලික පහසුකම්වත් ලබාදීමට හැකි නම් එය ප්‍රදේශිය ආර්ථිකය සංවර්ධනයට විශාල රැකුලක්. ඒත් එක්කම රජයට හැකියාව තිබෙනවා ව්‍යාපාර සම්බන්ධයෙන් මධ්‍යම රජය යටතේ ක්‍රියාත්මක වන ආයතන හා වාණිජ මණ්ඩල සම්බන්ධ කිරීමට. එවිට මේ දේවල් ඒකාබද්ධ කිරීම තුළින් ව්‍යපාරිකයින්ට පහසුකම් රැසක් ලබාදිය හැකියි. ඒ හරහා ව්‍යපාරිකයින්ගේ පැත්තෙන් ඇතිවන බොහෝමයක් ගැටලු අවම කරගන්න පුළුවන්. වාණිජ මණ්ඩල දැනට සිටින තත්ත්වයෙන් ඉහළට ඒමට නම් මෙයට රජයේ අතහිත ලැබිය යුතු බව ප්‍රකාශ කළ යුතුමයි.

**තේජනි ගමගේ**
සංවාදය